**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

**හෙද පුහුණු පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීම - 2026**

**විද්‍යුත් අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්**

1. අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර ගැසට් නිවේදනය සහ මෙම උපදෙස් පත්‍රිකාවේ සඳහන් සියලු කරුණු ඉතා හොඳින් කියවන්න.

2. අයදුම්පත් ඉදිරිපත් කල යුත්තේ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ www.health@gov.lk නිළ වෙබ් අඩවිය ඔස්සේ පමණි.

3. මේ සඳහා සුදුසුකම් ලබන්නේ 2021,2022,2023,හෝ 2024 වර්ෂවල යන විභාග වලින් එකකදී ජීව විද්‍යා සහ භෞතික විද්‍යා විෂය ධාරාවන්ගෙන් අ.පො.ස. (උ.පෙළ) විභාගය සමත් වූවන් පමණි. ( වැඩිදුර තොරතුරු ගැසට් නිවේදනයේ ඡේද අංක 02. යටතේ දැක්වෙන අංක 01 වගුවේ සඳහන් වේ.)

4. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය 2026.06.30 වේ.

5. එක් අයදුම්කරුවෙකුට ඉදිරිපත් කල හැක්කේ එක් අයදුම්පතක් පමණි. (ගැසට් නිවේදනයේ 1.1. ඡේදය බලන්න.)

6. රුපියල් 1000/- මුදල ගෙවීම අන්තර්ජාල බැංකු සේවා හෝ මුදල් තැම්පත් කිරීමේ යන්ත්‍ර මගින් **සිදු නොකල යුතුය.**

7. සෑම අයදුම්කරුවෙකුම තම අයදුම්පත ඉදිරිපත් කිරීමට පෙර ලංකා බැංකු ශාඛාවකට ගොස් රු.1000/- ක මුදල ගෙවිය යුතුය. ඒ සඳහා බැංකුවෙන් ලැබෙන **රිසිට් පත, ඔබ සම්මුඛ පරීක්ෂණයට කැඳවූවහොත් එහිදී ඉදිරිපත් කිරීම සඳහා සුරක්ෂිතව තබාගන්න.** එසේ නොකරන එනම්, අයදුම්පත ඉදිරිපත් කල පසු මුදල් ගෙවා ඇති සහ මුදල් නොගෙවා අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියලු අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ගැසට් නිවේදනයේ 1.4. සහ 6.3. ඡේද බලන්න.)

8. අයදුම්පත විධිමත් පරිදි ඉදිරිපත් කිරීමට ඔබ ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනය නිවැරදිව ඇතුලත් කළයුතුය.(ඔබට විද්‍යුත් තැපැල් ලිපිනයක් නොමැතිනම් ඔබ පළමුව විද්‍යුත් තැපැල් ලිපිනයක් සකස්කර ගතයුතුය) අයදුම්පතට අදාළව තොරතුරු නිවැරදිව සම්පූර්ණ කල පසු ඔබගේ විද්‍යුත් ලිපිනයට එහි පිටපත සෑම අයදුම්කරුවෙකු විසින්ම අනිවාර්යයෙන්ම භාගත කර ගත යුතු අතර (Print out) ලබා ගෙන සුරක්ෂිතව තබාගත යුතුය. එලෙස අයදුම්පතෙහි පිටපතක් ඔබගේ විද්‍යුත් ලිපිනයට අදාළව **(Inbox/spam)** වෙත උඩගත නොවුනේනම ඔබ නිවැරදිව අයදුම්පත් ඉදිරිපත් කර නැත. විද්‍යුත් ලිපිනයට අයදුම්පත නොලැබෙන අයදුම්කරුවන් නොපමාව මානව සම්පත් කළමනාකරණ හා සම්බන්ධීකරණ අංශය අමතන්න. (ගැසට් නිවේදනයේ 6.4. ඡේදය සහ 6.5.ඡේදය බලන්න.)

9. පහත සඳහන් නුසුදුසුකම් පවතින සිසුන් මේ සඳහා අයදුම් නොකල යුතුය.( ගැසට් නිවේදනයේ 1.2. අනුඡේදය සහ 5. ඡේදයේ 5.1 සිට 5.5 දක්වා සඳහන් අනුඡේද බලන්න.)

(අ). විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවත්නා රජයේ විශ්වවිද්‍යාලයක, රජයේ විශ්වවිද්‍යාල විද්‍යායතනයක උසස් පෙළ සුදුසකම් වලින් බඳවාගනු ලබන උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා රජයේ නිදහස් අධ්‍යාපන වරප්‍රසාද යටතේ අභ්‍යන්තර ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචි වී සිටින / හදාරමින් සිටින සිසුන්

විශේෂඥ වෛද්‍ය ඩබ්ලිව්.කේ. වික්‍රමසිංහ
අතිරේක ලේකම් (වෛද්‍ය සේවා)
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

(ආ). ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය අතුලු වෙනත් රජයේ ආයතන වල උසස් පෙළ ප්‍රතිඵල මත බඳවාගනු ලබන පූර්ණ කාලීන පාඨමාලාවක ලියාපදංචි සිටින /හදාරමින් සිටින සිසුන්

**10.** කිසිදු අයදුම්කරුවෙකු තම මාර්ගගත අයදුම්පතට ව්‍යාජ තොරතුරු ඇතුලත් නොකල යුතුය. (ගැසට් නිවේදනයේ 1.3. ඡේදය බලන්න.)

**11.** ජංගම දූරකථන අංකයක් ඇතුලත් කල යුතුය. අයදුම්කරුට තමාගේ සහ පියාගේ/මවගේ/භාරකරුගේ ජංගම දූරකථන අංකයද ඇතුලත් කල හැකිය.

**12.** අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා අයදුම්කරු සතුව තිබිය යුතු ලේඛන හා තොරතුරු. (ගැසට් නිවේදනයේ 1.4. ඡේදය බලන්න.)

- ජාතික හැඳුනුම්පත
- ඔබගේ උස (සෙ.මී) වලින් දැක්විය යුතුය
- අ.පො.ස. (සා.පෙළ) / (උ.පෙළ) සහතිකපත් සහ **Z** අගය දැක්වෙන ලේඛනය
- ඇමතුම් ලබාදියහැකි ජංගම දූරකථන අංක දෙකක්
    - රු. 1000/- ක ගාස්තුව ගෙවූ බවට <u>බැංකුවෙන් ලද රිසිට්පත</u> (ගැසට් පත්‍රයේ 6.3. ඡේදය බලන්න)

13. **අන්තර්ජාලය හරහා අයදුම්පත සම්පූර්ණ කිරීමේදී සැලකිය යුතු කරුණු ;**

(අ). අයදුම්පත සම්පූර්ණ කල යුත්තේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණි.

(ආ). අ.පො.ස.(උ.පෙළ) විභාගයේදී යොදාගත් ජාතික හැඳුනුම්පත් අංකයම භාවිතා කල යුතුය.

14. **අත්‍යාවශ්‍ය තොරතුරු දැනගැනීම සඳහා විමසීම්**

මෙම පාඨමාලා සඳහා අයදුම්කිරීමට සියළු සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අයදුම්පත සම්පූර්ණ කිරීමේදී කිසියම් ගැටලුවක් ඇති වුව හොත් ඒ සම්බන්ධයෙන් තාක්ෂණික සහාය ලබාගැනීම සඳහා හෝ ඉහත ගැසට් නිවේදනයේ 6.4. (ඇ). ඡේදයේ දැක්වෙන ගැටලුවක් නිරාකරණය කර ගැනීම සඳහා පමණක් සතියේ වැඩකරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා කාලය තුල සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මානව සම්පත් කළමනාකරණ හා සම්බන්ධීකරණ ඒකකයේ දූරකථන අංක 0112 340 007 අමතන්න. <u>hrcodmoh@gmail.com</u> විද්‍යුත් තැපැල් ලිපිනයෙන්ද සම්බන්ධ විය හැකිය. <u>**(විද්‍යුත් තැපැල ඔස්සේ සම්බන්ධ වන සෑමවිටම එහි ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය සහ දූරකථන අංකයක් සඳහන් කිරීම අනිවාර්ය වේ.)**</u>

<u>**වෙනත් කරුණු පිළිබඳව විමසා ඇමතුම් ලබාදීමෙන් වලකින්න.**</u>

**15.** ගැසට් නිවේදනයේ 8.1. ඡේදය අනුව සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමෙන් පසු තෝරාගත් අයදුම්කරුවන් පිළිබඳ තොරතුරු මෙම අමාත්‍යාංශයීය වෙබ් අඩවියේ පළකරනු ලබන අතර, කිසිවෙකුට පුද්ගලිකව දැනුම් දෙනු නොලැබේ.කෙසේ වෙතත්, අවස්ථානුකූලව පැනනගින විශේෂිත තොරතුරු පිළිබඳව දැනුවත් කිරීමට අවශ්‍ය වුවහොත් ඒවා ඔබ විසින් අයදුම්පත සමග ඉදිරිපත් කර ඇති දූරකථන අංක සහ විද්‍යුත් තැපැල් ලිපිනය ඔස්සේ සිදුකරනු ලැබේ. එබැවින්, අයදුම්පත සමග ඉදිරිපත් කරන ලද දූරකථන අංක සහ විද්‍යුත් තැපැල් ලිපිනය නොවෙනස්ව, සක්‍රියව තබාගැනීම ඔබගේ වගකීමක් වන අතර, එවායේ වෙනස්වීම් මත හෝ අක්‍රියව පැවතීම මත අදාල තොරතුරු නිසි කලට සංනිවේදනය නොවීම නිසා සිදුවිය හැකි ගැටලු සහගත තත්වයන් සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය වගකියනු නොලැබේ.

විශේෂඥ වෛද්‍ය ඩබ්ලිව්.කේ. වික්‍රමසිංහ
අතිරේක ලේකම් (වෛද්‍ය සේවා)
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.